# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/9 - 2012 දෙසැම්බර් මස 17 වැනි සඳුදා - 2012.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ, 2008 ජනවාරි මස 01 වැනි දින අංක 1530/13 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් 05 වැනි දින අංක 1465/19 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය 2013.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත උපලේඛණයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

එම උපලේඛනයේ 01, 02, 03, 04 හා 05 වැනි අයිතමයන් ඉවත් කර ඒ වෙනුවට පිළිවෙලින් පහත සඳහන් අයිතමයන් ආදේශ කිරීමෙන් :-

| | | |
|---|---|---|
| "1. | යම් දිව්රුම් පෙත්සමක් | රු. 250.00 |
| 2. | රක්ෂණ ඔප්පුවක්<br>ඔප්පුව මත ගෙවිය යුතු මුළු වාරික මුදලෙහි සෑම රු.1,000/- ක් හෝ ඉන් කොටසක් සඳහා | රු. 1.00 |
| 3. | ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍රය | රු. 2,000.00 |
| 4.(අ) | මත්පැන් විකිණීමේ නිරත වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් හැර වෙනත් යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ ඊකියාවක් කරගෙන යාමට බලපත්‍රයේ සඳහන් යම් කාලපරිච් -ජේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | රු. 2,000.00 හෝ බලපත්‍ර ගාස්තු වෙන් 10%යන මේවයින් කවර හෝ අඩු මුදල |
| (ආ) | මත්පැන් විකිණීම සඳහා වූ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට බලපත්‍රයේ සඳහන් යම් කාලපරිච්ජේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | රු. 20,000.00 |
| 5. | යම් කාලපරිච්ජේදයක් තුළ ණය කාඩ්පතක් (ක්‍රෙඩිට් කාඩ්) භාවිතා කරමින් ඇතුළත් වූ ගණු දෙනුවක් සඳහා ගෙවිය යුතු වන, මූල්‍ය හෝ සේවා ගාස්තු අඩංගු නොවන යම් මුදල් ප්‍රමාණයක් සඳහා හිමිකම් පෑමක්, ඉල්ලීමක් හෝ අයැදීමක්<br>එම මුදලෙහි සෑම රු.1,000/- ක් හෝ ඉන් කොටසක් සඳහා | රු. 15.00" |

01 - 383

1A - PG 01493 — 2335 (2012/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.